සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

25A | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- ♦ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- ♦ I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක්වා සමඟ නොගැලපේ. එම නොගැළපෙන නාමය තෝරා එයට අදාළ අංකය දී ඇති හිස්තැනෙහි ලියන්න.**

01. 1. හින්දුකුෂ් 2. සුලෙයිමාන් 3. සත්පුර 4. බෝලාන් 5. වින්ධ්‍යා (.....)
02. 1. ශුංග 2. ගුප්ත 3. ඉන්දු ග්‍රීක 4. ශක 5. කුෂාණ (.....)
03. 1. අශ්වඝෝෂ 2. නාගර්ජුන 3. වසුබන්ධු 4. කාලිදාස 5. පාර්ශව (.....)
04. 1. භාජා 2. බෙද්සා 3. කාර්ලේ 4. නාලන්දා 5. කන්හේරි (.....)
05. 1. අමරසිංහ 2. ශංකු 3. ධන්වන්තරී 4. වාල්මිකී 5. වරහමිහිර (.....)
06. 1. මේඝදූත 2. ඍතුසංහාරය 3. මෘච්ඡකටිකා 4. ශාකුන්තලය 5. රඝු වංශය (.....)
07. 1. නාලන්දා 2. වික්‍රමශිලා 3. ඕදන්තපුරි 4. උජ්ජෙයිනි 5. ජගන්දලා (.....)
08. 1. දන්ති දුර්ග 2. ධ්‍රැව 3. ගෝවින්ද 4. ක්‍රිෂ්ණ 5. හර්ෂවර්ධන (.....)
09. 1. මහානදී 2. ක්‍රිෂ්ණ 3. තුංගභද්‍ර 4. සින්දු 5. කාවේරි (.....)
10. 1. නිගණ්ඨනාථපුත්‍ර 2. අජිත කේශකම්බල 3. පූර්ණ කස්සප 4. ගෞතමීපුත්‍ර 5. මක්ඛලි ගෝසාල (.....)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය තෝරා එයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.**

11. 1. මෞර්ය - බෘහද්රථ
    2. ශුංග - පුෂ්‍යමිත්‍ර
    3. ඉන්දු ග්‍රීක - මිනැන්ඩර් (මිලින්ද)
    4. කුෂාණ - කණිෂ්ක.
    5. ගුප්ත - හර්ෂවර්ධන. (.....)

12. 1. කාලිදාස - මාලවිකාග්නිමිත්‍ර
2. විශාකදත්ත - මුද්‍රාරාක්ෂය
3. අමරසිංහ - අමරකෝෂය
4. ශූද්‍රක - රඝුවංශය
5. ආර්යභට - සූර්ය සිද්ධාන්ත (.....)

13. 1. අවන්ති - චණ්ඩ පජ්ජෝත.
2. කෝසල - ප්‍රසේනජිත්
3. මගධ - බිම්බිසාර
4. කුරු - බ්‍රහ්මදත්ත.
5. වාත්ස - උදයන (.....)

14. 1. නිෂ්ක - මුදල් ඒකකයක්
2. පුර - ඉන්දු ශිෂ්ටාචාරයේ නගර හා බලකොටු
3. වත්ස - කෞසම්බියේ අගනුවර
4. දස රාජ්‍ය - සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයාණ
5. මණ්ඩලම් - චෝළ පරිපාලන ඒකකයකි. (.....)

15. 1. ඛාරවේල - හතිගුම්පා
2. රුද්‍රාදාමන් - ජුනාගාද්
3. කණිෂ්ක - භෝගාස්කොයි
4. සමුද්‍රගුප්ත - අලහබාද්
5. II පුලකේශීන් - අයිහෝල් (.....)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X සහ Y තීරුවේ දී ඇත. එහෙත් Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුව සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දී ඇත්තේ අනු පිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ නිවැරදිව ගලපා නිවැරදි වරණය තෝරා හිස්තැනෙහි ලියන්න.**

X Y

16. 1. ඉන්ද්‍රප්‍රස්ථ A ගංගා - යමුනා දෙගම්මැදියේ
2. කෞෂම්බි B යමුනා නිම්නයේ
3. හරප්පා C සත්ලෙජ් හා රාවි නදීන් අතර
4. නාසික් D ගෝදාවරී නිම්නයේ
5. භාරුකච්ඡ E නර්මදා මුවදොර
1. ABCDE 2. ACBED 3. ADBCE 4. AECBD 5. ADECB (.....)

X Y

17. 1. බින්දුසාර රජු A අමිත්‍රඝාත
2. අශෝක රජු B වාතාපිකොණ්ඩ
3. I චන්ද්‍රගුප්ත C සකල උත්තරාපථනාථ
4. හර්ෂවර්ධන රජු D ප්‍රියදර්ශී
5. නරසිංහවර්මන් රජු E මහාරාජාධිරාජ
1. ABCDE 2. BAECD 3. BCDEB 4. ADECB 5. CABED (.....)

| | | X | | Y |
|---|---|---|---|---|
| 18. | 1. | දිල්ලිතෝප්‍රා ටැම් ලිපිය | A | මාගේ ධර්මය යනු කුමක්ද පැනයට පිළිතුරු |
| | 2. | හවන ගිරි ලිපිය | B | සියලු මනුෂ්‍යයෝ මාගේ දරුවෝය |
| | 3. | ධෞලි ගිරි ලිපිය | C | මුළු ලොවට වැඩ සැලසීම. |
| | 4. | 13 වන ගිරි ලිපිය | D | සියලු ආගම්වලට ගරු කිරීම. |
| | 5. | 12 වන ගිරි ලිපිය | E | දිග් විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම. |

1. ABCDE 2. BACED 3. ACBED 4. CABDE 5. DABCE (.....)

| | | X | | Y |
|---|---|---|---|---|
| 19. | 1. | I වන චන්ද්‍රගුප්ත | A | ක්‍රි.පූ. 269 |
| | 2. | අශෝක | B | ක්‍රි.ව. 78 |
| | 3. | සමුද්‍රගුප්ත | C | ක්‍රි.ව. 320 |
| | 4. | කණිෂ්ක | D | ක්‍රි.ව. 335 |
| | 5. | පුෂ්‍ය මිත්‍ර | E | ක්‍රි.පූ. 185 |

1. ABCAD 2. CADBE 3. BCADE 4. CABDE 5. DBACE (.....)

| | | X | | Y |
|---|---|---|---|---|
| 20. | 1. | ක්‍රිෂ්ණා | A | මාල්වා උස්බිම් |
| | 2. | සින්දු | B | හිමාලයා |
| | 3. | චම්බාල් | C | ඩෙකැන් සානුව |
| | 4. | බ්‍රහ්මපුත්‍ර | D | බටහිර ඝාට්ස් |
| | 5. | මහානදී | E | ටිබෙට් |

1. ADCBE 2. BEDCA 3. CBAEA 4. DBAEC 5. ECBAD (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ යොදන්න.**

21. කාලිංගය මගධයට ඈඳගත් රජතුමා කවුරුන්ද?
    1. බිංදුසාර 2. කුණාල 3. I චන්ද්‍රගුප්ත 4. අශෝක 5. බෘහද්රථ (.....)

22. කණිෂ්ක රජුගේ රාජධානියට අයත් වූ වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානය කුමක්ද?
    1. පාඨලී පුත්‍ර 2. පුරුෂපුරය 3. සාගල 4. දිල්ලිය 5. මථුරා (.....)

23. ඍග් වෛදික යුගයේ ''දවසට අධිපති'' දෙවියන් කවුරුන්ද?
    1. ඉන්ද්‍ර 2. වරුණ 3. අග්නි 4. සූර්ය 5. උෟෂා (.....)

24. අශෝක රාජ්‍ය සමයේ නිර්මාණයවූ අපූර්වතම කලා නිර්මාණය කුමක්ද?
    1. සාංචි ස්ථූපය 2. අශෝක ස්ථම්භ 3. සාරානාත් ස්තම්භය
    4. අලහබාද් සෙල්ලිපිය 5. අක්ෂර කලාව (.....)

25. 'මිලින්ද පඤ්හ' ග්‍රන්ථයේ කර්තෘ වරයා කවරෙක්ද?
    1. මිලින්ද 2. වරහමිහිර 3. වසුබන්ධු 4. නාගසේන 5. නාගර්ජුන (.....)

- **අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

26. විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර,
    1. ඉන්දීය ඉතිහාසය පිළිබඳ වැදගත්ම සටහන් ලියා ඇත්තේ හියුංසාං හිමියන් විසිනි.
    2. සමකාලීන ඉන්දියාව පිළිබඳව වැදගත් තොරතුරු රැසක් මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා කෘතියේ අන්තර්ගත වේ.
    3. ටොලමි විසින් ලියන ලද භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය ග්‍රීක මූලාශ්‍රය.
    4. ඉන්දියාවේ භූගෝලීය ලක්ෂණ, සමාජය, පාලනය ආදී වැදගත් තොරතුරු රැසක් මේවායෙහි අන්තර්ගත වේ.
    5. භ්‍රමණ වෘත්තාන්තය හියුංසාං හිමියන් විසින් රචනා කරන ලදී. (.....)

27. කාලිදාස
    1. ශ්‍රී ලංකාවේ කුමාරදාස රජු කාලිදාසයන්ගේ සමකාලීනයකු ලෙස සැලකේ.
    2. කාලිදාස සන්දේශ කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකේ.
    3. මිලින්ද රජු කාලිදාසගේ ශිෂ්‍යයෙකි.
    4. රඝුවංශය හා කුමාරසම්භවය මොහුගේ ශ්‍රේෂ්ඨ කාව්‍ය ග්‍රන්ථ දෙකකි.
    5. කාලිදාස යනු දෙවන චන්ද්‍රගුප්ත රාජ්‍ය සභාවේ සිටි එක් පඬිවරයෙකි. (.....)

28. මෞර්‍යයන් යටතේ පාටලීපුත්‍ර නගරයේ පරිපාලනයයි.
    1. නගරය ආරක්ෂාවූයේ දැවයෙන් කළ පවුරකින් හා දිය අගලකිනි.
    2. වෙළඳපොලේ විකුණන ලද භාණ්ඩවලින් බද්දක් අය කරන ලදී.
    3. නගරය පාලනය කරන ලද්දේ 30 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මගිනි.
    4. කමිටුව අනු කමිටු 6කට බෙදා තිබුණි.
    5. කමිටුවේ ප්‍රධානියා වූයේ භාණ්ඩගාරිකය. (.....)

29. හර්ෂවර්ධන රජතුමා,
    1. මොහු මහායාන බෞද්ධාගම ඇදහූවකු විය.
    2. තම සහෝදරයාගේ මරණයෙන් පසු හර්ෂවර්ධන ථානේශ්වරයේ රජවිය.
    3. පුරාණ ඉන්දියාවේ අන්තිම අධිරාජ්‍ය බිහිකළ රජෙකු ලෙස ඉතිහාසඥයන් විසින් හර්ෂවර්ධන හඳුන්වනු ලබයි.
    4. හර්ෂවර්ධන විසින් අශෝක මරා කාලිංගය යටත් කරගන්නා ලදී.
    5. හර්ෂවර්ධන රජුගේ දකුණේ යුධ ව්‍යාපාරය චාලුක්‍ය වංශික දෙවන පුලකේශීන් විසින් වාර්තා කරන ලදී. (.....)

30. පාල රාජ්‍ය සමයේ සංස්කෘතික වැදගත්කම.
    1. ඉන්දියාවේ අවසන් බෞද්ධ අධිරාජ්‍ය වේ.
    2. පාල රජවරුන් බුදු දහමට ප්‍රබල අනුග්‍රහයක් දක්වන ලදී.
    3. මෙම පාලකයන් විසින් සංස්කෘතික සේවාවන් රැසක් සිදුකරනලදී.
    4. ධර්මපාල රජු නාලන්දා විහාරයට ගම්වර පූජා කිරීම. (.....)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදිව ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  **A සහ B පමණක් නිවැරදිනම් 1 ද,**

  **Bසහ C පමණක් නිවැරදි නම් 2 ද,**

  **C සහ D පමණක් නිවැරදි නම් 3 ද,**

  **A සහ C පමණක් නිවැරදි නම් 4 ද,**

  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. ගුප්ත සංස්කෘතිය,
    - A ගුප්ත යුගයේදි බොහෝ සාහිත්‍ය කෘති සංස්කෘත භාෂාවෙන් ලියැවුණි.
    - B මෙම යුගයේදී බ්‍රාහ්මණ ආගම හින්දු ආගම බවට පත්විය.
    - C මෙම යුගයේදී වඩාත් වන්දනාවට ලක්වූයේ ඉන්ද්‍ර දෙවියන්ය.
    - D අවුකන පිළිමය මෙම යුගයේ උසස් මූර්තියක් ලෙස සැලකේ. (.....)

32. මෞර්ය ප්‍රාදේශීය පාලනය
    - A අධිරාජ්‍ය පාලන ඒකකවලට බෙදා නොතිබුණි.
    - B මෞර්යය අධිරාජ්‍යයේ විශිෂ්ඨතම පාලකයා කණිෂ්ක රජුය.
    - C වරෙක උජ්ජෙයිනීය අශෝක රජු විසින් පාලනය කරන ලදී.
    - D අගනුවරට අයත් පාලන ඒකකය අගරජුගේ පාලනය යටතේ පැවතිණි. (.....)

33. සාතවාහනයෝ
    - A සාතාවාහන රාජ්‍ය පිහිටුවන ලද්දේ නැගෙනහිර ඩෙකෑනයේය.
    - B සාතාවාහන රාජධානියේ ආරම්භක පාලකයා පළමුවන සාතකර්ණීය.
    - C පුරාණ ග්‍රන්ථවල සාතවාහනයෝ ආන්ද්‍රයෙක් ලෙසහඳුන්වා ඇත.
    - D සාතවාහනයෝ ඩෙකෑනයේ බලය ලබාගන්නේ එහිසිටි කාණ්ඩවයන් නෙරපා දැමීමෙන් අනතුරුවය. (.....)

34. සමුද්‍රගුප්ත රජු,
    - A අශෝක ස්තම්භයක ලියා ඇති අලහබාද් ප්‍රශස්තිය සමුද්‍රගුප්ත පිළිබඳ තොරතුරු සපයන වැදගත් මූලාශ්‍රයකි.
    - B ඔහුගේ පළමු යුධ ව්‍යාපාරය නාග රජවරුන්ට විරුද්ධව දියත් කෙරිණි.
    - C ඊළඟ වැදගත් යුධ ව්‍යාපාරය දකුණු ඉන්දියානු රජවරුන්ට විරුද්ධවය.
    - D සිය යුධ ව්‍යාපාර අවසන් කිරීමෙන් අනතුරුව ඔහු අශ්ව මේධ යාගයක් පැවැත්වීමය. (.....)

35. හූණ ආක්‍රමණ,

A උතුරු ඉන්දියාවේ ප්‍රධානතම පාලකයෝ බවට පත් වූහ.

B මොවුන් උතුරු ඉන්දියාවේ එක්සත් භාවය විනාශ කළහ.

C කාශ්මීරයේ බෞද්ධ ආරාමසහ සිද්ධස්ථාන විනාශ කර දැමූහ

D මෙකල හින්දු දේව වන්දනය ජනප්‍රිය අංශයක් බවට පත් වී තිබිණි. (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | වැරදිය |
| 2. නිවැරදිය | නිවැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. මෞර්ය බලය බිඳවැටීමෙන් පසු බැක්ට්‍රියානු ග්‍රීකයන් අනාරක්ෂිත වූ වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කරන ලදී. | ඉන්දු ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ මිනැන්ඩර් හෙවත් මිලින්ද රජුය. (.....) |
| 37. කුෂාකයන් විදේශීය ප්‍රභවය ලැබූ රාජවංශයක් වුවත් ඉන්දීය සංස්කෘතියට විශාල අනුග්‍රහයක් දැක්වීම. | කුෂාණ පාලකයන් විසින් තුන්වන ධර්ම සංඝායනාව පැවැත්වීම. (.....) |
| 38. සමුද්‍ර ගුප්ත රජුගේ බල ව්‍යාප්තිය අදියර 6ක් යටතේ සිදුවිය. | මොහු පිළිබඳව හැදෑරීමටඇති ප්‍රධානතම ලේඛනය හරිසේනගේ අලහබාද් ප්‍රශස්තියයි. (.....) |
| 39. මහා කවි කාලිදාස ජෛන භක්තිකයෙකු වීම. | ඔහු ස්කන්ධදේව උත්පත්තිය අළලා රඝුවංශය නම් මහා කාව්‍ය ග්‍රන්ථයක් රචනා කිරීම. (......) |
| 40. ස්කන්ධ ගුප්ත රජුගෙන් පසු ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය උදාවිය. | දුර්වල පාලකයින් බලයට පත්වීම, අභ්‍යන්තර අරගල, ප්‍රාදේශීය පාලකයින් බලයට පත්වීම, ආර්ථික පරිහානිය, විදේශ ආක්‍රමණ මෙම යුගයේදී ඇතිවිය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) හින්දු කුෂ් | (ii) භාරුකච්ච | (iii) හරප්පා | (iv) කැලිකට් |
| (v) ඉන්ද්‍රප්‍රශ්ථ | (vi) තක්ෂිලා | (vii) තප්ති ගඟ | (viii) ජුනාගාද් |
| (ix) සාංචි | (x) යමුනා | (xi) මථුරා | (xii) අජන්තා |

(නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 1 බැගිනි)

## B කොටස

02. පැරණි ඉන්දීය ඉතිහාසය හැඩ ගැසීම කෙරෙහි අභ්‍යන්තර භූගෝලීය සාධකවල බලපෑම,
(i) ගංගා පද්ධතිය (ii) දුර්ග මාර්ග (iii) කඳුවැටි
(iv) කාන්තාව හා සානු යන අංශ යටතේ පැහැදිලි කරන්න. (ල. 16)

03. 'පශ්චාත් වෛදික යුගය ඉන්දීය ඉතිහාසයේ පරිවර්තන යුගයකි.'
(i) ආර්යයන් ඉන්දියාවට පැමිණියේ යැයිසැලකෙන ප්‍රදේශය කුමක්ද? (ල. 1)
(ii) වෛදික යුගයේ ජනාවාස ප්‍රධාන වශයෙන් පිහිටා තිබුණු ගංගාව සහ පශ්චාත් වෛදික යුගයේදී ජනාවාස ප්‍රධාන වශයෙන් පිහිටා තිබුණු ගංගා දෙක පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) පශ්චාත් වෛදික යුගය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උපයෝගී කරගත හැකි මූලාශ්‍ර 2ක් නම් කරන්න. (ල. 2)
(iv) පශ්චාත් වෛදික යුගයේ සමාජයෙහි ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 4)
(v) ඍග් වෛදික යුගයේ ආගමික විශ්වාස හා චාරිත්‍ර තත්වයක් පශ්චාත් වෛදික යුගයේදී වෙනස් වී ඇති ආකාරය පරීක්ෂා කරන්න. (ල. 7)

04. ''ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය යනු පැරණිතම ඉන්දියානු සභ්‍යත්වයයි''
(i) මෙම ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවල කැණීම් කළ පුරෝගාමී විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
(ii) ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට අයත් ප්‍රධාන නගර 2ක්නම් කරන්න. (ල. 2)
(iii) ඉන්දු නිම්න වැසියන්ගේආගමික විශ්වාස පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
(iv) මෙම ශිෂ්ටාචාරය නාගරික සභ්‍යත්වයක් ලෙස හඳුනා ගැනීමට උපකාරී වනසාධක පරීක්ෂා කරන්න. (ල. 8)

05. පහත දැක්වෙන මාතෘකා දෙකක් අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව සටහන් ලියන්න.

(i) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර
(ii) සොළොස් මහා ජනපදවල ක්‍රියාත්මකවූ පාලනය ක්‍රම
(iii) මගධ අධිරාජ්‍ය
(iv) භාරත මූලාශ්‍ර (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

## C කොටස

06. ''කුෂාණ යුගයේ වැදගත්ම පාලකයා කණිෂ්ක රජුය.''

(i) කුෂාණ රජ පරපුරේ මුල්ම පාලකයා සහ ඔහුගෙන් පසු බලයට පත් පාලකයා පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(ii) කුෂාණවරුන්ගේ මුල් නිජ බිම සහ ඔවුන්ගේ ගෝත්‍රය පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) කුෂාණ යුගයේ ආගමික හා සංස්කෘතික වැදගත්කම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 4)
(iv) ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් කණිෂ්ක රජුගේ දේශපාලන සංසිද්ධිය විස්තර කරන්න (ල. 8)

07. සමුද්‍රගුප්ත රජුගේ දේශපාලන කාර්ය සාඵල්‍ය අගයන්න. (ල. 16)

08. 'පශ්චාත් ගුප්ත යුගය උතුරු ඉන්දියාවේ කැපී පෙනෙන ලක්ෂණ පෙන්නුම් කරයි.''

(i) පශ්චාත් ගුප්ත යුගයේ බලවත් වූ ප්‍රාදේශීය රාජ්‍යයන් 02 ක් නම් කරන්න. (ල. 2)
(ii) හර්ෂවර්ධන රජු අයත් රාජවංශය සහ ඔහු පිළිබඳ තොරතුරු සඳහන් මූලාශ්‍රය පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
(iii) හර්ෂවර්ධන රාජ්‍ය සමයේආගමික හා සාහිත්‍ය කටයුතු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.(ල. 4)
(iv) ඉහත ප්‍රකාශය සනාථ කරමින් හර්ෂවර්ධන රජුගේ දේශපාලන කාර්ය භාරය විස්තර කරන්න. (ල. 8)

09. පහත මාතෘකා 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ගුප්ත යුගයේ සංස්කෘතිය
(ii) යානවාහන සමයේ සංස්කෘතික කටයුතු
(iii) පාල රාජවංශයේ සංස්කෘතික කටයුතු
(iv) II චන්ද්‍රගුප්ත රජු (එක් කොටසකට ලකුණු 8 බැගිනි)